# 2.22 ජනප්‍රිය ඉන්දියානු සිනමාවේ නිරූපිත නව දේශපාලන සිනමා ලක්ෂණ රංග් දේ බසන්තී චිත්‍රපටය ඇසුරෙන් කෙරෙන අන්තර්ගත විශ්ලේෂණයකි

චන්දිමා නිශ්ශංක
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය වශ්වවදයාලය.
අතුල සමරකෝන්
ලලිත කලා අධ්‍යයන අංශය, පේරාදෙනිය විශ්වවිද්‍යාලය.

---

## ABSRACT

21 වන සියවසේ ගෝලීයකරණය වූ නව සමාජය මත ජන මාධ්‍යයේ ආධිපත්‍යය තදින් ක්‍රියාත්මක වේ. ජනමාධ්‍ය තාක්ෂණය මෙන්ම එහි න්‍යාය තුළ ද නව ප්‍රවනතා ගොඩ නැගී ඇත. සැප්තැම්බර් 11 අමෙරිකානු ලෝක වෙළෙඳ සංකීර්ණයට එල්ල වූ ප්‍රහාරයෙන් පසුව ඉස්මතු වූ නව ජන මාධ්‍ය ප්‍රවනතාවක් නම් දේශප්‍රේමී මාධ්‍යවේදයයි. (Patriotic journalism) මෙය new journalism හි නව ප්‍රභේදයක් ලෙස ද හඳුන්වා දී ඇත. අවදානමට මුහුණ දුන් සමාජයන් තුළ එම කම්පනයෙන් හා අනතුරෙන් අත් මිදීම පිණිස සිදු කෙරෙන මාධ්‍ය ක්‍රියාකාරිත්වය මෙසේ හඳුන්වනු ලැබේ. මෙය දේශපාලන සංනිවේදන ප්‍රවනතාවක් වෙයි. සිනමාව තුළ ද මෙබඳු මාධ්‍ය මාදිලි භාවිත කෙරෙනු දැකිය හැකිය.

මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කරනුයේ ජනප්‍රිය ඉන්දියානු චිත්‍රපට කෙරෙහිය. මෙම චිත්‍රපට අන්තර්ගතය හා සංදේශය වශයෙන් හුදු විනෝදාත්මක චිත්‍රපට නොව නව දේශපාලන සිනමා ප්‍රවනතාවක් ලෙස වර්ධනය වන අයුරු අනාවරණය කර ගැනීම මෙහි අරමුණ වෙයි. මූලික වශයෙන් මෙම චිත්‍රපටවල තේමාව, කථා පුවත, චරිත තෝරා ගැනීම, දෙබස්, රූපරාමු සැලැස්ම, පසුතල නිර්මාණයල අංග රචනය ආදී අංග මගින් දේශානුරාගය ඉස්මතු කෙරෙන අතර නව යටත් විජිතවාදයට ගෝලීයකරණයට අභියෝග කිරීමේ මතවාදී දැක්මක් ද සහිතය.

2000/2006 වසර 6 තුළ බිහි වූ ජනප්‍රිය චිත්‍රපට 50ක් විමසා බලන විට මෙම දේශානුරාගය සහිත චිත්‍රපට ධාරා කිහිපයක් හඳුනා ගත හැකිය.

1. නිශ්චිත ඓතිහාසික චරිත පදනම් කරගත් චිත්‍රපට - නිදසුන් ලෙස අශෝක්
2. ජන කතා ආදියෙහි සඳහන් වන නිර්නාමික ප්‍රාදේශීය වීරයන් සහිත චිත්‍රපට - නිදසුන් ලෙස ලගාන්
3. අධිරාජ්‍යවාදයට එරෙහිව සිදුවූ මුල්කාලීන නැගිටීම් පදනම් කරගත් චිත්‍රපට - නිදසුන් ලෙස මංගල් පාන්ඩේ
4. නිදහස් සටනට දායක වූ නිශ්චිත දේශපාලන චරිත පදනම් කරගත් චිත්‍රපට - නිදසුන් ලෙස භගත් සිං
5. නූතන ඉන්දියානු දේශපාලන ගැටලු විවරණය කිරීම හා දේශානුරාගය නිරූපනය කිරීම පදනම් කරගත් චිත්‍රපට - නිදසුන් ලෙස වීර් සාරා
6. අතීත දේශපාලන ප්‍රවාහය දෙස විවේචනාත්මකව බලමින් එම චරිත සමකාලීන සමාජයට ආදේශ කරන චිත්‍රපට - නිදසුන් ලෙස රංග්දේ බසන්තී

ජනප්‍රිය සිනමා ධාරාවේ බටහිර චිත්‍රපට (හොලිවුඩ් චිත්‍රපට) ද පුද්ගල වීරයන් ඉස්මතු කරන්නට උත්සාහ කරයි. ඔවුහු නිර්නාමික වීරයෝ වෙති. ශරීර ශක්තිය හා ආරෝහ පරිනාහ දේහය ආදිය මගින් වීරත්වය විදහා පාන මෙම චරිත සටන් කරනුයේ පැහැදිලිව හඳුනාගත නොහැකි සතුරෙකු සමඟය.

අමෙරිකානු යුධ වීරත්වය ඉස්මතු කිරීම පිළිබඳ දේශපාලන අරමුණ එතුළ ගැබ් වී තිබුන ද සිනමා තාක්ෂණය හා ක්‍රියාදාම භාවිතයන් හැර මතවාදී ඉදිරිපත් කිරීම් ගැඹුරින් ඉස්මතු කෙරෙනු දැකිය නොහැකිය.

ජනප්‍රිය ඉන්දියානු චිත්‍රපට තුළ ඉතා පැහැදිලි ලෙස දේශප්‍රේමය පිළිබඳ පණිවුඩය අඩු වැඩි වශයෙන් වුවද නිශ්චිත ලෙස සදහන් වේ. එමෙන්ම එය නව යටත් විජිතවාදයට, ගෝලීයකරණයට හා එහි බලපෑම් සහිත දේශීය දේශපාලන ක්‍රමයට නිශ්චිත ලෙසම එරෙහි වෙයි. නව ඉන්දියානු සිනමා වීරයා ශරීර ශක්තිය විදහා පාන්නෙක් නොව අධ්‍යාත්මික ගුණ සහිත ආසියානු වටිනාකම් වලින් හෙබි පුද්ගලයෙක් ලෙස නිරූපිතය. ඔහු සමාජ පරිවර්තනයක් හා වඩා යහපත් ජීවිතයන් සිය ජනතාව වෙනුවෙන් ඉල්ලා සිටී. මෙම අධ්‍යයනයේදී ඉහත ලක්ෂණ රංග් දේ බසන්ති කෘතියෙහි කතා පුවත චරිතල දෙබස්, රූප භාවිතය, සංස්කරණය හා අන්තර්ගත පණිවුඩය ඇසුරින් විශ්ලේෂණය කරනු ලැබේ.

ඇමෙරිකානු සන්නිවේදන විද්වතුන් හඳුන්වා දෙන අවදානම් සහිත සමාජයන්ගේ අවශ්‍යතාවක් ලෙස පැන නගින දේශප්‍රේමී මාධ්‍ය භාවිතය නම් නව ප්‍රවනතාවයට අයත් නිර්මාණ ලෙස මේවා වර්ග කළ හැකිය. එහෙත් එය යටත් විජිත භාවයට මුහුණ දුන් රටවල මාධ්‍ය වේදය තුළ නව ප්‍රවනතාවක් නොවේ.

1970 දශකයේදී ඍජු දේශපාලන තේමා රැගත් යථාර්තවාදී චිත්‍රපට දහරාවක් තෙවැනි සිනමාව නමින් ලතින් ඇමෙරිකානු සිනමා කරුවන් වන ප්‍රනාන්දු සොලනාස් හා ඔක්ටාවියෝ ගෙටිනෝ විසින් හඳුන්වා දෙනු ලැබිණි. එම දේශපාලන සිනමාව වර්තමානය වන විට අභාවයට ගොස් තිබේ. ප්‍රේම වෘත්තාන්තයක් විචිත්‍ර පසුතල ගීත, නැටුම්, සටන් ආදිය සමඟ මායාමය ආඛ්‍යාන ශෛලියකින් ඉදිරිපත් කරන අතරම අතිශය ගැඹුරු දේශපාලන මතවාදී පණිවුඩයක් ජන සමාජය තුළට ගෙන යන නව දේශපාලන සිනමා දහරාවක් ලෙස ජනප්‍රිය ඉන්දියානු සිනමාව හඳුනාගත හැකිය.